# සංක්ෂිප්තය

මෙම පර්යේෂණය භෞතික විද්‍යාව විෂය යටතේ ඉලෙක්ට්‍රොනික විද්‍යාව ඒකකයේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳව කළ විස්තරාත්මක අධ්‍යයනයකි. තාක්ෂණික ලෝකය තුළ ඉදිරියට ගමන් කිරීමට උදව් වන ඉලෙක්ට්‍රොනික උපාංග පිළිබඳ හැදෑරීමට ඉලෙක්ට්‍රොනික විද්‍යාව ඒකකය යටතේ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විද්‍යා අංශයේ සිසුන්ට අවස්ථාව ලැබී ඇත. නමුත් මෙම ඒකකය සිසුන් තුළ එතරම් ජනප්‍රිය නොවන බව භෞතික විද්‍යාව විෂය ඉගැන්වීමේ නියුතු පර්යේෂිකාවට හැගුණි. මේ සඳහා විවිධ හේතු බලපා හැක.

මෙම අධ්‍යයනය තුළින් 1997-2005 දක්වා පැවති අධ්‍යයන පොදු සහතික පත්‍ර ( උසස් පෙළ ) විභාගයේ දී භෞතික විද්‍යාව දෙවන ප්‍රශ්න පත්‍රයෙහි ඉලෙක්ට්‍රොනික විද්‍යාව ඒකකය සඳහා ලබාදී ඇති ප්‍රශ්නයට සිසුන් පිළිතුරු සපයා ඇති ආකාරය පිළිබඳවත්, භෞතික විද්‍යාව විෂය ඉගැන්වීමේ නිරත ගුරුවරුන්ට ඉලෙක්ට්‍රොනික විද්‍යාව පිළිබඳව ඇති න්‍යායික හා ප්‍රායෝගික දැනුම පිළිබඳවත්, ඉලෙක්ට්‍රොනික විද්‍යාව පිළිබඳව විෂය දැනුම ලබා ගැනීම සඳහා ගුරුවරුන්ට ලැබී ඇති අවස්ථා පිළිබඳවත්, පාසල්වල ඉලෙක්ට්‍රොනික විද්‍යාව ඉගැන්වීම සඳහා පවතින භෞතික සම්පත්වල ප්‍රමාණාත්මක බව හා උපයෝගිතාව පිළිබඳවත්, උසස් පෙළ විද්‍යා විෂය ධාරාව හැදෑරීමට පැමිණෙන සිසුන්ගේ ඉලෙක්ට්‍රොනික විද්‍යාව පිළිබඳව ඇති මූලික පෙර අත්දැකීම් පිළිබඳවත් විමසන ලදි

. අධ්‍යයනය දියත් කරන ලද්දේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ නැගෙනහිර ගම් පළාත, තඹුත්තේගම හා කැකිරාව යන අධ්‍යාපන කලාප වල 1 AB පාසල් දහයක සිසුන් 140ක් හා එම පාසල්වලම භෞතික විද්‍යාව විෂය ඉගැන්වීමේ

නිරත ගුරුවරුන් දාහතර දෙනෙක් නියැදිය වශයෙන් තෝරා ගෙනය. මෙහිදි පර්යේෂණ උපකරණ හතරකින් දත්ත හා තොරතුරු රැස්කරන ලදි.

මෙහිදි ලැබුණු නිගමනයන් අතුරින් වඩාත් වැදගත් වන්නේ භෞතික විද්‍යාව විෂය ඉගැන්වීමේ නිරත ගුරුවරුන්ට ඉලෙක්ට්‍රොනික විද්‍යාව පිළිබඳව විෂය දැනුම ලබා ගැනිම සඳහා ලැබී ඇති අවස්ථා අඩුබවයි. තවද ඉලෙක්ට්‍රොනික විද්‍යාව ඒකකය ඉගැන්වීමට වෙන්කර ඇති කාලච්ඡේද ප්‍රමාණවත් නොවන බව අනාවරණය විය. පර්යේෂණය අවසානයේ ඉලෙක්ට්‍රොනික විද්‍යාව ඒකකයේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනයට අවශ්‍යය යෝජනා ඉදිරිපත් කර ඇති අතර අනාගත පර්යේෂණ සඳහා මගපෙන්වීමක් ද සිදුකර ඇත.